# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1994/68 - 2016 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2016.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2014.08.28 දිනැති අංක 1877/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ, 2014.10.01 දිනැති අංක 1882/18 හා 2016.02.02 දිනැති අංක 1952/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධනය කරන ලද්දා වූ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවට පහත සඳහන් සංශෝධනයන් එක් කරනු ලබන අතර, එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

01. **ක්‍රියාත්මක වන දිනය** : මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2006.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

20. **අන්තර්කාලය හා උසස්වීම්**

20.1 අන්තර් කාලය 2006.01.01 දින සිට 2012.06.30 දින දක්වා බලපැවැත්වේ. එම කාලය තුළ පහත සුදුසුකම් හා අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ගේ උසස්වීම් පහත සඳහන් පරිදි සිදු කළ යුතු ය.

20.1.1 සේවයේ 11 ශ්‍රේණියට උසස් කිරීම.

I. 2006.01.01 වන දිනට පෙර සේවයට බැඳී III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ නිලධාරියෙකු, අංක 888/2 හා 1995.09.12 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* හා ඊට අදාළ සංශෝධන මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි, සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ සිට II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරා තිබිය යුතු සියළු සුදුසුකම් සහ අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි අන්තර් කාලය තුළ දි II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

II. ඉහත පරිදි සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් වූ නිර්දේශ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත.

20.1.2 සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම.

I. 2006.01.01 දිනට පෙර සේවයට බැඳී II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ හෝ අන්තර් කාලය තුළදී II ශ්‍රේණියට උසස් කරනු ලැබූ නිලධාරීන්, අන්තර් කාලය තුළදී පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සෑම අතින්ම සම්පූර්ණ කරනු ලබන්නේ නම්, එම දින සිට ක්‍රියාත්මක වන පරිදි, I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

*(අ)* උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
*(ආ)* උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය නොවී තිබීම.
*(ඇ)* පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම හා අඛණ්ඩව පවත්වා ගෙන යාම.

II. ඉහත පරිදි සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් වූ නිර්දේශ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත.


1A - G 24643— 17 (2016/11)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

20.1.3 සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

I. 2006.01.01 දිනට පෙර සේවයට බැඳි I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ හෝ අන්තර්කාලය තුළ දී I ශ්‍රේණියට උසස් කරනු ලැබූ නිලධාරීන්, අන්තර්කාලය තුළ දී පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සැම අතින්ම සම්පූර්ණ කරනු ලබන්නේ නම් විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා 10.3.1.1 හි සඳහන් පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

i. වාස්තු විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

ii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

iii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන සේවා ගණයේ/තනතුරුවලට අදාළ විධායක ශ්‍රේණියේ වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

v. පූර්ණ වෘත්තීය සුදුසුකම් අඛණ්ඩව පවත්වාගෙන යාම.

vi. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් වී නොතිබීම.

02. අන්තර්කාලීන විධිවිධානයන් අංක 20 යටතේ සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම හේතුවෙන්, ''වෙනත්'' යන්න අංක 21 ලෙස සංශෝධනය විය යුතු ය.

03. සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය සංශෝධනය වීම මත, 2006.01.01 දින සිට 2013.04.05 දින දක්වා සිදු කරනු ලබන උසස්වීම් සඳහා හිඟ වැටුප් නොගෙවිය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

12 - 468

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.